අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

# බෞද්ධ ශිෂ්ටාචාරය

## විෂය නිර්දේශය

( 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# 1.0 හැඳින්වීම

අධ්‍යාපන සංවර්ධනයේ දී විෂය මාලාවට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ජාතික අවශ්‍යතාවලට ගැළපෙන අයුරෙන් විෂයමාලා වෙනස් කිරීම කාලීනව සිදුවේ. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6-11 ශ්‍රේණිවල සිසුන්ට 2007 වර්ෂයේ සිට හඳුන්වා දෙනු ලැබූ බුද්ධ ධර්මය විෂය ඉගෙනීම තුළින් බුදු දහමේ ප්‍රධාන ඉගැන්වීම්, ශාසනික ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතික පසුබිම යටතේ අදාළ ශ්‍රේණිවලට ප්‍රමාණවත් වන පරිදි කරුණු හැදෑරීමට අවස්ථාව සලසන ලදී. එය නිපුණතා පාදකව සිදුවුණි.

එම අරමුණු ඉටුකර ගනිමින් අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත්ව අ.පො.ස. (උ.පෙළ) පන්තියට ඇතුළත් වන ශිෂ්‍යයා බෞද්ධ ශිෂ්ටාචාරය විෂය හැදෑරීමෙන් බෞද්ධාගමික මූලික ඉගැන්වීම, සදාචාරය, සංස්කෘතිය පිළිබඳ විමර්ශනාත්මක, විචාරශීලී ගවේෂණයකට වැඩි දුරටත් යොමු වීමක් බලාපොරොත්තු වේ. එමගින් 6-11 ශ්‍රේණිවල ලබා ගත් බුද්ධ ධර්මය විෂය නිපුණතා වඩාත් සුවිශේෂී තත්ත්වයකට පත් කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

පැවති විෂය නිර්දේශයට වඩා, හඳුන්වා දෙනු ලබන මෙම නිපුණතා පාදක විෂය අන්තර්ගතය ශිෂ්‍ය මිත්‍රශීලී වන ආකාරයට ඉදිරිපත් කරන්නට කටයුතු කර ඇත. එබැවින් වැඩි ශිෂ්‍ය පිරිසක් වඩාත් රුචිකත්වයෙන් යුතුව විෂය හැදෑරීමට පෙළඹෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අසා දැන ගැනීමට වඩා තමා විසින් ම කරුණු එක්රැස් කිරීම, ඒවා බෙදා විග්‍රහ කිරීම, එම කරුණුවල අන්තර්ගතය භාවිතයට ගැනීම පිළිබඳ අවබෝධය ශිෂ්‍යයාට ලැබෙන පරිදි විෂය නිර්දේශයේ කරුණු ක්‍රියාවට නැගිය යුතු වේ. එහිදී පහත සඳහන් කරුණු ද තහවුරු වනසේ ක්‍රියා කිරීම අපේක්ෂිතය.

නිපුණතා සියල්ල සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය විෂය දැනුමෙන්, ආකල්ප වලින්, කුසලතාවන්ගෙන් හා ජීවන යහපුරුදු වලින් පිරිපුන් මනා බෞද්ධ පෞරුෂයකින් හෙබි ඉගෙනුම් ලාභියෙකුගේ බිහිවීම බලාපොරොත්තු වේ.

## 2.0 විෂය අරමුණු

බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය බුදුරජාණන් වහන්සේගේ ලොව පහළ වීමත් සමඟ ම දායාද වූවකි. ලෞකික දියුණුව සහ ලෝකෝත්තර දියුණුව සඳහා ප්‍රගුණ කළ යුතු ජීවන ප්‍රතිපදාවක් බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළින් ඉදිරිපත් කෙරේ.

මෙම ජීවන ප්‍රතිපදාව සහ ඒ මත ගොඩනැගුණු සමාජ උරුමය , දරුවන්ගේ අනාගත ජීවිත සාර්ථක කර ගැනීමට සහාය විය හැකි අයුරෙන් ඉදිරිපත් කිරීම සඳහා බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය නිර්දේශය සකස් වී ඇත.

මෙම කාර්යය සම්පූර්ණ කර ගැනීමට විෂයය නිර්දේශයේ සඳහන් නිපුණතා දහයෙන් පහත සඳහන් අරමුණු සාක්ෂාත් වන පරිදි කටයුතු කිරීම වැදගත් වේ.

- බෞද්ධ ආකල්ප - ආගමික සංස්කෘතික, සාමාජික වශයෙන් තම ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා උපයෝගී කර ගැනීම.
- දයාව, කරුණාව, මෛත්‍රියෙන් පෝෂිත සමාජයක් ඇති කර ගැනීමට කටයුතු කිරීම.
- බෞද්ධාගමික - සංස්කෘතිය පෝෂණය කරමින් තවදුරටත් පවත්වා ගැනීම.
- අන්‍යොන්‍ය සබැඳියාවෙන් කටයුතු කිරීමේ හැකියාව වඩාත් වර්ධනය කර ගැනීම.
- බෞද්ධාගමික සංස්කෘතිකාංග අධ්‍යයනය කොට වඩාත් සුවදායී සමාජයක් ගොඩනැංවීමට දායක වීම.
- පුද්ගල යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ ව මනාව දැනුවත් වීම.
- භෞතික පරිසරය හා සම්පත් කළමනාකරණය පිළිබඳ ව ඉගැන්වෙන බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනයෙන් සමාජ හිතකාමී අයකු බවට පත්වීම.
- අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාට ගරු කරන සහනශීලී සමාජයක් ඇති කිරීමට උත්සාහ ගැනීම.
- මානව හිතවාදිත්වය හා මානව භක්තිය ඇති සියලු ම සත්ත්වයන්ට හිතවාදී අයෙකු වීම.

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| | I | 1.1, 1.2, 1.3,1.4<br>2.1 | 100 |
| 12 | II | 2.2<br>3.1, 3.2, | 100 |
| | III | 4.1, 4.2<br>5.1,5.2 | 100 |
| | I | 6.1,6.2,6.3<br>7.1 හි පළමුවන ධර්ම සංගායනාව තෙක් | 100 |
| 13 | II | 7.1 හි දෙවන ධර්ම සංගායනාවේ සිට<br>7.2,7.3,<br>8.1,8.2 | 100 |
| | III | 9.1,9.2,9.3<br>10.1,10.2, 10.3 | 100 |

# 3.0 විෂය නිර්දේශය

## 3.1 - 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 1.0 ප්‍රාග් බෞද්ධ හා බුද්ධ කාලීන භාරතීය සමාජීය, ආගමික, දේශපාලන හා ආර්ථික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අවබෝධයක් ලබයි. | 1.1 බුද්ධ කාලීන භාරතීය බ්‍රාහ්මණ සමාජ ධර්ම හා ඒ පිළිබඳ බෞද්ධ විචාරය අධ්‍යයනය කරයි. | • වර්ණ ධර්ම, ස්ව ධර්ම, ආපද් ධර්ම, ආශ්‍රම ධර්ම පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් හා ඒවා පිළිබඳ බෞද්ධ විචාරය. | 22 |
| | 1.2 භාරතීය සමාජය තුළ කාන්තාවට හිමි වූ තැන විමර්ශනය කරයි. | • ප්‍රාග් වෛදික චින්තනය තුළ කාන්තාව<br>• වෛදික චින්තනය තුළ කාන්තාව<br>• බෞද්ධ චින්තනය තුළ කාන්තාව | 24 |
| | 1.3 ෂට් ශාස්තෘන් ඇතුළු ශ්‍රමණ ගුරුකුල වල පහළවීම බමුණන් ඇති කළ සමාජ පීඩනයද හේතු කොට ඓතිහාසිකව සිදුවු බව වටහා ගනිමින් ශ්‍රමණ, බ්‍රාහ්මණ විශේෂතා හඳුනා ගනියි. | • ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් සහ සෙසු ශ්‍රමණ ගුරුකුල හඳුනා ගැනීම.<br>• බ්‍රාහ්මණ සංස්කෘතිය, ශ්‍රමණ සංස්කෘතිය හා ඒවායේ විශේෂිත ලක්ෂණ | 19 |
| | 1.4 රාජාණ්ඩු පාලනයේ නැගීම ගෝත්‍රික, රාජ්‍යයන්ගේ බිඳ වැටීම, සිටුවර පංතියේ නැගී සිටීම හා නාගරීකරණය පිළිබඳ ව අවබෝධ කර ගනියි. | • කෝසල, මගධ, වත්ස, අවන්ති යන රාජාණ්ඩු<br>• වාණිජ්‍යකරණය<br>• නාගරීකරණය<br>(වෙළෙඳුන්, වෙළෙඳ මාර්ග මුදල් භාවිතය, වෙළෙඳ නගර, පිළිබඳ තොරතුරු) | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 2.0 පුද්ගලයා හා සමාජය පිළිබඳ බෞද්ධ මතය වටහා ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 2.1 සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ විග්‍රහය විමර්ශනය කරයි.<br><br>2.2 පුද්ගලයාගේ ස්වාමිත්වය, ස්වච්ඡන්දතාව, හා වගකීම විමර්ශනය කරයි. | • සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ විග්‍රහය<br>• පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම්<br>• පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | 10<br><br>18 |
| 3.0 බෞද්ධ ඉගැන්වීම් දේශපාලන හා සමාජ සංවිධානවල යහපැවැත්ම පිණිස උපයෝගීවන ආකාරය විමර්ශනය කර යහ පාලනයට දායකවෙයි. | 3.1 රාජ්‍ය පාලනය සඳහා බෞද්ධ ඉගැන්වීම් යොදා ගතහැකි ආකාරය පිළිබඳ ව දැනුවත් බවක් ඇති වෙයි. | • දස රාජධර්ම<br>• දස සක්විතිවත්<br>• සප්ත අපරිහාණිය ධර්ම<br>• සතර සංග්‍රහ වස්තු<br>• සතර අගති | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 3.2 සිව්වණක් පිරිස පිළිබඳ බෞද්ධ ඉගැන්වීම විමසුමට ලක් කරමින් පුද්ගලයා හා සමාජය අතර ඇති සම්බන්ධය පිළිබඳ බෞද්ධ විග්‍රහය ගෙනහැර දක්වයි. | • භික්ෂු - භික්ෂුණී උපාසක - උපාසිකා<br>• භික්ෂු සංඝ හා ශ්‍රාවක සංඝ<br>• සදාචාරාත්මක පදනම<br>• අන්‍යෝන්‍ය ගෞරවය හා සුහදතාව<br>• යුතුකම් හා වගකීම් ඉටු කිරීම<br>• නීතිගරුකත්වය හා සාමය<br>• පුද්ගල වගකීම් හා යුතුකම් පිළිබඳ බෞද්ධ විග්‍රහය | 50 |
| 4.0 බෞද්ධ ආචාර ධර්ම පිළිබඳ මූලික අවබෝධය ලබා ගනිමින් උභයාර්ථ සාධනයට මග පාදා ගනියි. | 4.1 පින්පව් කුසල් අකුසල් හඳුනා ගනිමින් ඒවා නිශ්චය කිරීම පිළිබඳ බෞද්ධ නිර්ණායක පැහැදිලි කරයි. | • දස කුසල් හා දස අකුසල්<br>• දස පින් කිරියවත්<br>• පින් පව් කුසල් අකුසල් නිශ්චය කිරීමට අදාළ බෞද්ධ නිර්ණායක | 24 |
| | 4.2 ශ්‍රද්ධාව, ප්‍රඥාව හා පුද්ගල සංවර්ධනය හා සමාජ සංවර්ධනය පිළිබඳ බෞද්ධ මතය හඳුනා ගනියි. | • ශ්‍රද්ධාව හා භක්තිය අතර වෙනස<br>• ශ්‍රද්ධාව,ප්‍රඥාව හා ආධ්‍යාත්මික සංවර්ධනය<br>• පන්සිල් ආරක්ෂා කිරීම තුළින් ඇතිවන සමාජ සුරක්ෂිතතාව<br>• පුද්ගල හා සමාජ අභිවෘද්ධියට හිතකරවූ අල්පේච්ඡතාව | 28 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 5.0 පරිසරය, ආර්ථිකය හා සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගික ජීවිතයට එක්කර ගනියි. | 5.1 සත්ත්වයා කෙරෙහි බලපාන්නා වූ භෞතික පරිසරය පිළිබඳ බෞද්ධ විග්‍රහය ඉදිරිපත් කරයි. | • සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල කාලීන වැදගත්කම<br>• බුදු දහම සෞන්දර්ය හා රසාස්වාදය අගය කරන අයුරු<br>• විවේකය හා ධාර්මික ප්‍රීති සුඛය අගය කිරීම.<br>• සත්ත්වයාගේ යහපත සඳහා භෞතික පරිසරය බලපාන ආකාරය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | 30 |
| | 5.2 සැපය ධනෝපායනය හා පරිහරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනය කරයි. | • සැපය පිළිබඳ බෞද්ධ සංකල්පය සහ ජීවිත ගැටලු විසඳීමෙහි ලා එහි ඇති උපයෝගීතාව<br>• ශ්‍රමය, ධනය හා සමාජ ශුභ සිද්ධිය අතර පවත්නා අන්‍යොන්‍ය සම්බන්ධතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | 18 |

## 3.2 - 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 6.0 බුදුරජාණන් වහන්සේ විශිෂ්ට චරිත ලක්ෂණ හා උන්වහන්සේ විසින් ගොඩ නගන ලද භික්ෂු සමාජයේ සැකැස්ම ගවේෂණය කරමින් එහි රක්ෂණයට හා පෝෂණයට දායක වෙයි. | 6.1 මහා කරුණාව, මහා ප්‍රඥාව හා පෞරුෂය බුද්ධ චරිතයේ සුවිශේෂ ලක්ෂණ ලෙස ගැඹුරින් හදාරමින් බුදුරජාණන් වහන්සේගේ තාදී ගුණය හා පද්මාකාර ජීවිතය ප්‍රකට වන අවස්ථා ඉදිරිපත් කරයි. | • මහා කරුණාව<br>• මහා ප්‍රඥාව<br>• ආදර්ශවත් නායකත්වය<br>• විශිෂ්ට ශාස්තෘත්වය<br>• තාදී ගුණය<br>• පද්මාකාර ජීවිතය | 40 |
| | 6.2 නිදහස් චින්තනය ආගමික සහනශීලි බව හා බුදුරජාණන් වහන්සේ පිළිබඳ තත්කාලීන ඇගයීම් විමර්ශනය කරයි. | • නිදහස් චින්තනය සහ ආගමික සහනශීල බව<br>• බුදුරජාණන් වහන්සේ පිළිබඳ තත්කාලීන ඇගයීම් | 14 |
| | 6.3 බෞද්ධ භික්ෂු සමාජයේ ආරම්භය, සංවර්ධනය හා පාලන සංවිධානය අධ්‍යයනය කරයි. | • භික්ෂු සමාජයේ ආරම්භය<br>• භික්ෂු සමාජයේ ව්‍යාප්තිය<br>• පැවිද්ද හා උපසම්පදාව<br>• වස් විසීම, උපෝසථය සහ පවාරණය | 28 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 7.0 බුදුරජාණන් වහන්සේ වැඩසිටි සමයේ සිට කණිෂ්ක රාජ්‍ය සමය තෙක් බෞද්ධ ඉතිහාසය හා ක්‍රියාකාරකම් විමසමින් ශාසන සංරක්ෂණයට යොමු වෙයි. | 7.1 බුද්ධ කාලීන ධර්ම දූත සේවය විමර්ශනයට ලක් කරමින් ථෙරවාද ධර්ම සංගායනා තුන අධ්‍යයනය කොට ශාසන සංරක්ෂණය සඳහා සැලසුම් සකස් කරයි. | • බුද්ධ කාලීන ධර්ම දූත සේවා<br>• සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා නිර්මල බුදු දහම රැක ගැනීමට දැරූ ප්‍රයත්නය<br>  • පළමුවන<br>  • දෙවන<br>  • තෙවන ධර්ම සංගායනා<br>• භාරතීය බෞද්ධ විශ්ව විද්‍යාල | 42 |
| | 7.2 අශෝක රජතුමාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය හා එහි ජයග්‍රහණ අධ්‍යයනය කරයි. | • අශෝක අධිරාජයා බෞද්ධ රාෂ්ට්‍ර පාලකයකු වශයෙන්<br>• එතුමාගේ ශාසනික මෙහෙය | 20 |
| | 7.4 කණිෂ්ක රජතුමාගේ ශාසනික මෙහෙය අධ්‍යයනය කරයි. | • කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවය | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 8.0 බෞද්ධ ශිෂ්ටාචාරය ශ්‍රී ලංකාවේ ස්ථිරසාර සංවර්ධනයට පදනම් වූ ආකාරය විමසා බලමින් එහිලා ලාංකේය රජවරුන්ගේ දායකත්වය ආදර්ශයට ගනියි. | 8.1 මහින්දාගමනය සහ ප්‍රාග් මහින්ද යුගයේ පැවති විශ්වාස අධ්‍යයනය කර බුදු සමය නිසා හැඩගැසුණු ලාංකේය සමාජයේ, සාරධර්ම, චත් පිළිවෙත් හා සිරිත් විරිත් විමසා බලයි. | • ප්‍රාග් මහින්ද යුගයේ පැවති ඇදහිලි විශ්වාස සහ බුදු සමය ඒ කෙරෙහි දැක්වූ ආකල්ප<br>• මහා විහාරය හා අභයගිරිය කේන්ද්‍රකර බිහිවූ ආගමික සාමාජීය හා සංස්කෘතික ලක්ෂණ<br>• බෞද්ධ සිරිත් විරිත් හා ගොඩනැගුණු සමාජ සාරධර්ම | 26 |
| | 8.2 රාෂ්ට්‍ර පාලනය කෙරෙහි බෞද්ධ බලපෑම දේවානම් පියතිස්ස රාජ්‍ය සමයේ සිට මහසෙන් රාජ්‍ය සමය තෙක් විමසීමට ලක් කරයි. | • රාෂ්ට්‍ර පාලනය කෙරෙහි බෞද්ධ බලපෑම, දේවානම් පියතිස්ස රාජ්‍ය සමයේ සිට මහසෙන් රාජ්‍ය සමය දක්වා ක්‍රියාත්මක වූ බෞද්ධ දේශපාලන මූලධර්ම හා ඒවායේ භාවිතය අධ්‍යයනය | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 9.0 විවිධ රටවල බෞද්ධ උරුමය ගවේෂණය කරමින් බුදු සසුනේ අනාගත චිරස්ථිතිය පිළිබඳ ව සංවේදීව ක්‍රියා කරයි. | 9.1 බුරුමයට (මියන්මාරයට) සහ සියම (තායිලන්තය ) බුදු සමය හඳුන්වා දීම සහ ඒ රටවල සංස්කෘතිය බුදු සමයෙන් ලද පෝෂණය පිළිබඳ ගවේෂණය කරයි. | • බුරුමයට (මියන්මාරයට) බුදු සමය හඳුන්වා දීම සහ එරට සංස්කෘතිය බුදු සමයෙන් ලද පෝෂණය<br>• බුදු සමය සංවර්ධනයට බුරුම රජවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහය<br>• (සියමට) තායිලන්තයට බුදු සමය හඳුන්වා දීම සහ බුදු සමයෙන් ලද පෝෂණය<br>• බුදුසමය සංවර්ධනයට තායිලන්ත රජවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහය | 24 |
| | 9.2 ශ්‍රී ලාංකික බෞද්ධ සම්බන්ධතා බුරුමය (මියන්මාරය) සහ සියම (තායිලන්තය )සමඟ ගොඩනැංවූ අයුරු විමර්ශනය කරයි. | • බුරුමය (මියන්මාරය ) සහ සියම (තායිලන්තය) සමඟ පැවති ශ්‍රී ලාංකීය බෞද්ධ සබඳතා | 10 |
| | 9.3 ජපානයට සහ චීනයට බුදු සමය හඳුන්වා දීම සහ එම රටවල සංස්කෘතිය, බුදු සමයෙන් ලද පෝෂණය අධ්‍යයනය කරයි. | • ජපානයට බුදු සමය හඳුන්වාදීම සහ ජපාන සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ අයුරු<br>• බුදුසමය සංවර්ධනයට ජපාන අධිරාජවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහය<br>• චීනයට බුදු සමය හඳුන්වාදීම සහ චීන සංස්කෘතිය බුදුසමයෙන් පෝෂණය වූ අයුරු<br>• බුදුසමය සංවර්ධනයට චීන අධිරාජ්‍යවරුන්ගේ ලැබුණු අනුග්‍රහය | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 10.0 භාරතයේ හා ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප සාහිත්‍ය ඇගයීමට ලක් කරමින් ඒවා සංරක්ෂණයට හා සංවර්ධනයට දායක වෙයි. | 10.1 භාරතයේ බුද්ධ ප්‍රතිමා හා ස්ථූප නිර්මාණයට අදාළ කලා සම්ප්‍රදාය හඳුනා ගනියි. | • භාරතයේ බුද්ධ ප්‍රතිමා හා ස්තූප සම්ප්‍රදාය | 12 |
| | 10.2 බුදු සමයේ ආභාසයෙන් අනුරාධපුර,පොළොන්නරු යුගවල ගොඩනැගුණු බෞද්ධ නිර්මාණ සංරක්ෂණයට දායක වෙයි. | • ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමාව, ස්ථූප,<br>• චේතියඝර, පටිමාඝර<br>• සඳකඩ පහණ | 14 |
| | 10.3 ශ්‍රී ලංකාවේ භාෂා, සාහිත්‍ය, කලාශිල්පයන්හි පෝෂණය සඳහා ලැබුණ බෞද්ධ ආභාෂය අගය කරයි. | සිංහල සාහිත්‍ය, කලා ශිල්ප (චිත්‍ර, මූර්ති, කැටයම්) ලලිත කලා | 16 |

# 4.0 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

නව දැනුම, අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂය සොයා යන උසස් පෙළ සිසුන්ට බෞද්ධ ශිෂ්ටාචාරය විෂය යටතේ පෘථුල අත්දැකීම් සම්භාරයක් ලබා ගනිමින් කරුණු සාක්ෂාත් කරගැනීමේ අධ්‍යාපනික පසුබිමක් සකසා දිය යුතු වේ.

දැනුම්, ආකල්ප,කුසලතා තුළින් ජීවිත යහ පුරුදු වඩාත් වැඩි වර්ධනය වන අයුරෙන්, බෞද්ධාගමික අධ්‍යාපන ක්‍රම නූතන ශිෂ්‍ය පරම්පරාවේ ප්‍රගමණය උදෙසා යොදාගත හැකිනම් වඩාත් ඵලදායීවනු නොඅනුමාන ය. ඒ අතුරෙන් පැවරුම් ක්‍රමය, ප්‍රශ්නෝත්තර ක්‍රමය, ගවේෂණ ක්‍රමය, ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රමය, සංවාද ක්‍රමය, දේශනා ක්‍රමය භාවිත කළ හැකි ය. ශිෂ්‍යයා නව නිර්මාණශලී චින්තනයට යොමු කිරීම ශිෂ්‍ය ජීවිතයේ දී පමණක් නොව සාමාජයීය ජීවිතයේ දී ද වැදගත් වේ.

ශිෂ්‍යයාගේ මානසික මට්ටමට අනුරූපව ගනු ලබන ප්‍රවේශයෙන් අපේක්ෂිත මට්ටම් කරා සාධනීය අයුරෙන් සාර්ථකත්වයට පැමිණීම ගුරුභවතාගෙන් අපේක්ෂා කෙරේ. දත් දෙයින් ශිෂ්‍යයා ගවේෂණශීලී මාවතට යොමු කළ හැකි ය. මෙහි දී ගුරුභවතා ශිෂ්‍යයාට මග පෙන්වමින් තමා ද අධීක්ෂණයේ යෙදෙමින් දිරිගැන්වීම් කළ යුතු ය. මෙහි දී ගුරුවරයා තවදුරටත් මගපෙන්වන්නකු , සම්පත් දායකයකු බවට පත්වීම අනිවාර්ය වේ.

විෂයය උගන්වන ගුරුභවතා ගුරු භූමිකාව තුළ විවිධ ශිල්ප ක්‍රම අනුගමනය කරමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයට අනුගත වීමට නිදහස ඇත. තමාගේ ඉගැන්වීම් අත්දැකීම් හරහා ඉගෙනුම් ක්‍රම විධි සකස් කර ගන්නට ගුරුවරයාට හැකිවිය යුතු ය. විෂයය ඉගැන්වීමේ දී ගුරුභවතා විෂය විශේෂඥයකු විය යුතු ය. මෙසේ දැනුමින් පරිපූර්ණ ගුරුභවතකු වෙතින් ශිෂ්‍ය සාධනය පමණක් නොව ගුරු බැතිය ද වර්ධනය වනු ඇත.

පන්තියට පැමිණි ගුරුභවතා අදාළ පාඩමට පිවිසීම උදෙසා විවිධ ක්‍රම අවස්ථෝචිතව හා පාඩමට අනුරූපව සකසා ගැනීම තුළින් ශිෂ්‍ය අවධානය වඩාත් ඵලදායක අයුරෙන් යොදවා ගත හැකි ය. නාට්‍යානුසාරයෙන් ප්‍රශ්න විචාරාත්මකව, කවි - ගීත ගායනා ඉදිරිපත් කිරීම, ශ්‍රව්‍ය දෘශ්‍ය පට භාවිත කිරීම මගින් ශිෂ්‍ය අවධානය ඉතා දැඩිව ලබාගත හැකිවනු ඇත. එමගින් ශිෂ්‍යයා ප්‍රබෝධාත්මක මානසික තත්ත්වයකට පත්කළ හැකි වේ. සෑම අවස්ථාවක ම පාඩමක් සැලසුම් කිරීමේදී ශිෂ්‍ය ක්‍රියාකාරීත්වයට මුල්තැන ලැබෙන සේ කටයුතු කළ යුතු ය. ශිෂ්‍ය දක්ෂතා ඔප් නැංවෙන අයුරෙන් සැලසුම් සැකසීම අවශ්‍යම ය. දීර්ඝ සටහන්දීමට වඩා විෂය කරුණු ගොනු කර ගැනීමේ හැකියාවත් ඒවා නැවත නිවැරදි ලෙස ලිඛිතව දැක්වීම සඳහා වූ හුරුවත් ශිෂ්‍යයාට ලබා දීමට ක්‍රියා කළ යුතු ය. මේ මගින් ලිවීමේ දුර්වලතා මගහරවා ගැනීමට ද හැකිවනු ඇත.

ශිෂ්‍යයන් අතර ප්‍රමුඛයන් - ප්‍රධානයන් නම් කිරීමට ගුරුභවතා උත්සුක නොවිය යුතු ය. නායකත්වය, මූලිකත්වය ශිෂ්‍යයන් තුළින් ම ගොඩ නංවා ගැනීමට අවස්ථාව දිය යුතු ය. ශිෂ්‍යයාගේ සැඟවුණ හැකියා විෂයානුසාරයෙන් සමාජගත කරන්නට ගුරුභවතා සමත්විය යුතු ය. ශිෂ්‍යයාට වගකීම් භාරගෙන කටයුතු කිරීමේ අවස්ථාව නිරන්තරයෙන් ම හිමිකරදීමත් විෂය සමගාමීව, ක්ෂේත්‍ර චාරිකා, කණ්ඩායම් ව්‍යාපෘති මගින් ඉගෙනුම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට පහසුකම් සලසාදීමත් ගුරුභවතාගේ වගකීම වේ.

කිසියම් විෂය බද්ධ කොටසක්, විෂය පිළිබඳ විශාරද දැනුමක් - ප්‍රවීණතාවක් ඇති සම්පත් දායකයකු මගින් ලබාදීම ද, අවශ්‍යතාව මත ඉටු කිරීමට ගුරුභවතාට නිදහස ඇත.

මෙසේ කටයුතු කිරීමෙන් විෂය දැනුමින් පමණක් නොව ආකල්ප, කුසලතා හා යහපුරුදු වලින් පරිපූර්ණ ශිෂ්‍ය ප්‍රජාවක් තනා සමාජයට යොමු කිරීමේ, දායාද කිරීමේ කාර්ය භාරයට දායක වන්නට ගුරුභවතාට හැකි වේ. ශිෂ්‍යයාද ප්‍රබෝධාත්මක නව නිර්මාණශීලී කෙනකු බවට පත්වනු ඇත.

## 5.0 පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන්

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අවධියේ ශිෂ්‍යයා බුද්ධ ධර්මය විෂය පිළිබඳ අදාළ නිර්දේශ අනුව දැනුමක් ලබා ඇත. මූලික ධර්ම කරුණු, සාමාජික,සංස්කෘතික හා දේශපාලන යන කරුණු ඔස්සේ වඩාත් පුළුල්ව අධ්‍යයනය කිරීමක් බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය යටතේ අ.පො.ස. (උ.පෙළ) සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කළ යුතු වේ.

බෞද්ධ ඉගැන්වීම්වල ජීවිතයේ ගැඹුරු ධර්ම කරුණු මෙන්ම සරල බාහිර පැත්තක් ද ආචාර විද්‍යාත්මක කරුණු ද ඇතුළත්ව පවතී. බෞද්ධ අධ්‍යාපනයේ විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් ය. ගැඹුරු ය.

දත් දෙයින් නොදත් දෙයට යාම බෞද්ධ ඉගැන්වීම වන අතර නූතන අධ්‍යාපන විද්‍යාවේ ද එය පිළිගෙන ඇත. ගුරුභවතා මග කියන්නෙක් මෙන්ම අධීක්ෂකයෙක් ද වන අතර ශිෂ්‍යයාට ඉගෙනුම සඳහා පහසුකම් සලසන්නා ද වේ. බුදු දහමෙහි මෛත්‍රිය , කරුණාව , දයාව වැනි උසස් ආකල්ප වර්ධනය කිරීමටත්, බුද්ධි වර්ධනය, විමංශනය, තර්කණය, පරිකල්පන ශක්තීන් අවධාරණය කිරීමටත් සුදුසු පරිදි විෂය නිර්දේශය සකස් කර ඇත. ශිෂ්‍යයාගේ ආකල්ප වඩා වර්ධනය වීමට අවශ්‍ය පරිසරය ගුරුභවතා විසින් ලබා දිය යුතු ය.

මෙහි දී මෙම විෂයය උගන්වන ගුරුභවතා බෞද්ධයකු වීම අනිවාර්ය විය යුතු අතර, ඔහු/ ඇය විෂය විශේෂඥයකුවීම අවශ්‍ය වේ. එමෙන්ම ආගමික ප්‍රතිපත්ති සුරකින, ගරු කරන , ආගමික හැඳියාවකින් යුක්ත අයකු වීම අත්‍යවශ්‍ය ය. විෂය ඉගැන්වීමේ දී සුදුසු පරිදි පන්ති වටපිටාව සකස් කර ගැනීමට ගුරුවරයාට මෙම කරුණු උපකාරවත් වේ.

බෞද්ධ ආගමික සංසදයක් ආරම්භ කොට ඒ මගින් ශිෂ්‍ය දක්ෂතා, හැකියා , ඔප් නංවන්නට කටයුතු සැලසුම් කළ යුතු ය. මේ මගින් බෞද්ධාගමික සාරධර්ම සම්බන්ධ වූ භාවනා, පිරිත්, ධර්ම සාකච්ඡා, ධර්ම දේශනා, දානමය පින්කම් සංවිධානය කිරීමට ගුරුභවතා විසින් ශිෂ්‍යයා යොමු කළ යුතු වේ. මෙම කරුණුවලට අමතරව බුද්ධි මණ්ඩල සාකච්ඡා, වාර ප්‍රකාශන, ක්ෂේත්‍ර චාරිකා , අධ්‍යාපන චාරිකා සැලසුම් කළ යුතු වේ.

මෙම අවස්ථාවලින් ලබන අත්දැකීම් ඔස්සේ ශිෂ්‍යයාගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනයට සහ යහපත් ජීවන දර්ශනයක් ගොඩ නැංවීමට අවශ්‍ය යහ පුරුදු ගොඩ නැගීමට හැකි වන සේ සැලසුම් සැකසිය යුතු ය.
පාරිසරික සංරක්ෂණයට අදාළ වන ගෙවතු වගා, පාසල් භූමි අලංකරණය, ජල සංරක්ෂණය හා කළමනාකරණය , වන වගා ව්‍යාපෘති සඳහා ශිෂ්‍ය දායකත්වය ලබා ගත යුතු ය. පරිසරය සුරක්ෂිත කිරීමේ ඇති වටිනාකම ශිෂ්‍යයන්ට ලබාදීමට මෙම වැඩ පිළිවෙළ වැදගත් වේ. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍ය කේන්ද්‍රීයව සැලසුම් සකස් කිරීම ගුරුභවතාගේ වගකීමකි. මෙහි දී බෞද්ධාගමික ඉගැන්වීම් ඉස්මතු වන පරිදි සැලසුම් කිරීමට අමතක නොකිරීම වැදගත් වේ.

පාසල පදනම් කරගත් ක්‍රියාවල දී සෑම අවස්ථාවක ම සටහන් තබා ගැනීමට ශිෂ්‍යයා යොමු කිරීම තුළින් වඩාත් ක්‍රමවත් ව නිරවුල් ව කටයුතු කිරීමේ අවස්ථාව සලස්වා දිය හැකි ය. මෙම කරුණු සැකසීමේ දී වාර්ෂිකව සැලසුමක් ඔස්සේ ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායක වනු ඇත.

වසර දහ තුනක් තිස්සේ ලත් ආගමික අධ්‍යාපනය මත වැඩදායක පුරවැසියකු සමාජයට උරුම කිරීමට හැකි අයුරෙන් පාසල් ප්‍රතිපත්ති හා ඒ හා අදාළ වැඩ සටහන් සම්පාදනය වීම වැදගත් ය.

# 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් - ඇගයීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතය.

13 වන ශ්‍රේණිය අවසානයේදී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිතය.

මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2011 වර්ෂයේ දී පැවැත්වේ.

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.